# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2186/12 – 2020 ජූලි 28 වැනි අඟහරුවාදා – 2020.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාරාහේන්පිට (කොට්ඨාස අංක 41 - කිරුළ කොළඹ මහ නගර සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක CO/DSO/2012/440 හා 2013.02.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අංක 34 – **කිරිමණ්ඩල මාවතේ වරි. අංක 483/18 දරන ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0045 ක් පමණ**

උතුරට: කිරිමණ්ඩල මාවත; නැගෙනහිරට: මෙම පිඹුරේ කැබලි අංක 35 සහ කිරිමණ්ඩල මාවතේ වරි. අංක සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම; දකුණට: කිරිමණ්ඩල මාවතේ වරි. අංක 483/18 දරන ඉඩම; බටහිරට: කිරිමණ්ඩල මාවතේ වරි. අංක 483/15A දරන ඉඩම සහ මෙම පිඹුරේ කැබලි අංක 33.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය : LD/05/2009/PC/134.
2020 මාර්තු මස 12 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 191